කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

# සැපයුම්කරුවන් ලියා පදිංචි කිරීම -2024

1. 1985 අංක21 ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ 2024 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.
2. ඒ සඳහා අදාල ආයතනයේ ලිපිශීර්ෂයක අයදුම්පතක් / අයදුම්පත් ලබාදෙන ලෙස ඉල්ලමින් නිකුත් කරන ලද ලිපියක් ඉදිරිපත් කිරීම මගින් කාර්යාංශයේ ප්‍රසම්පාදන අංශය වෙතින් අයදුම්පත් ලබාගැනීමේ හැකියාව පවතින අතර, අයදුම්පතෙහි අඩංගු තොරතුරු Online Application for the Registration of Suppliers -2024 ක්ලික් කර මාර්ගගත ක්‍රමවේදය ඔස්සේද කාර්යාංශය වෙත ලැබීමට සැලැස්විය හැක.
3. 2023.07.18 වන දින සිට 2023.08.06දින දක්වා රාජකාරී දිනයන්හිදී පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රසම්පාදන අංශය වෙතින් අයදුම්පත් නිකුත් කිරීම සිදුකරනු ලැබේ.සම්පූර්ණ කරන ලද අයදුම්පත් භාරගන්නා අවසන් දිනය 2023.08.07 දින ප.ව.1.00 දක්වා පමණක් වේ.
4. අයිතම එකක් හෝ කිහිපයක් සඳහා ඉල්ලුම් කල හැකි අතර , අයදුම්කරනු ලබන සෑම අයිතමයක් සඳහාම වෙන් වෙන්ව අයදුම් කිරීම සිදු කල යුතුය.
5. එම සෑම අයිතමයක් සඳහා ආපසු නොගෙවනු ලබන රු.1000/= ක මුදල, මුදලින් සහ කාර්යාංශය විසින් හඳුන්වා දී ඇති Online Payment Gateway හරහාද ගෙවිය හැකිය. මුදලින් ගෙවීම් කරනු ලබන සැපයුම්කරුවන් සඳහා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රධාන කාර්යාලයේ හෝ ඕනෑම ශාඛා කාර්යාලයකින් විශේෂ බැංකු පිළිපත් (Bank Slips) ලබා ගත හැකි අතර , චෙක්පත් භාරගනු නොලැබේ.එම මුදල දිවයිනේ ඕනෑම ලංකා බැංකු ශාඛාවකට ගෙවා එම පිළිපත් 2 (කාර්යාංශයේ පිටපත හා මුදල් අංශයේ පිටපත)අදාල අයදුම්පත සමඟ අමුණා එවීම අත්‍යාවශ්‍ය වේ.(උපලේඛනයේ සඳහන් එක් අයදුම් අංකයක් සඳහා එක් බැංකු පිළිපතක් පාවිච්චි කළ යුතු අතර සේවා අයිතම කිහිපයකට අයදුම් කරන්නේ නම් අයිතම සඳහා වෙන වෙනම බැංකු පිළිපත් අදාල අයදුම්පත් සමඟ ඉදිරිපත් කළ යුතුය.)
6. අයදුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් හා ඉදිරිපත් කළ යුතු ලිපිලේඛන පහත දැක්වේ.
   - 06.1 ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ සහතික කරන ලද පිටපතක් අනිවාර්යය වේ.(Business Registration Certificate)මෙහි ව්‍යාපාර ස්වභාවය අයදුම්කරන අයිතමයට ගැලපිය යුතුය.
   - 06.2 ගරාජයන් සඳහා ලියාපදිංචි වීමේදී,ප්‍රධාන කාර්යාලය හා අදාල ශාඛා කාර්යාල පරිශ්‍රයේ සිට කිලෝමීටර් 15ක දුර ප්‍රමාණයක පිහිටි ගරාජයන් විය යුත අතර , BRC හි සඳහන් ලිපිනයෙහි ගරාජය පිහිටා තිබිය යුතුය.(කාර්යාංශය විසින් ලියාපදිංචි කිරීමට පෙර අදාල ගරාජ් ආයතන පරීක්ෂා කිරීම සිදු කරනු ලබන අතර, කාර්යාංශයේ ශාඛා කාර්යාල ලිපිනයන් කාර්යාංශ නිල වෙබ් අඩවියේ සඳහන් කර ඇත.)
   - 06.3 උපලේඛනයේ සඳහන් අයිතම අංක 36,37,38 හා 39 ඇතුලත් ඉදිකිරීම් කටයුතු සඳහා අයදුම්කරන්නන් විසින් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (ICTAD)ලියාපදිංචි ලේඛණයෙන් උපුටාගත් සහතික කළ ඡායා පිටපතක් ඉදිරිපත් කළ යුතුය.
   - 06.4 පළපුරුද්ද සනාථ කරන ලේඛන
7. සියළුම ඉල්ලුම්පත් 2023.08.07 දින ප.ව.1.00 ට ප්‍රථම පහත ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් හෝ පැමිණ භාරදිය හැකි අතර , ඉල්ලුම්පත් බහාලන කවරයේ වම්පස ඉහල කෙලවරේ **"සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම -2024"** යනුවෙන් සඳහන් කළ යුතුය.
8. ලියාපදිංචි වන මෙම සැපයුම්කරුවන්ට අමතරව කාර්යාංශයට අවශ්‍ය භාණ්ඩ, වැඩ හා සේවා ප්‍රසම්පාදනය කිරීම සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව වෙනත් ක්‍රමවේද තෝරාගැනීමට කාර්යාංශයට හැකියාව ඇත.
9. මිල ගණන් සඳහා ලංසු ආරාධනා යොමු කළ පසු ඒ සඳහා තෙවරක් (3වරක්) ප්‍රතිචාර නොදැක්වීම, අසත්‍ය තොරතුරු / ලේඛන ඉදිරිපත් කිරීම, ඉල්ලුම් කරන ලද සැපයුම් හා සේවාවන් නිසි වේලාවට සැපයීමට අපොහොසත් වීම සහ අනුමත සාම්පල් වලට අනුකූලව සැපයීම නොකිරීම යන හේතූන් මත පූර්ව දැනුම් දීමකින් තොරව සැපයුම්කරුවන්ව සැපයුම් ලේඛනයෙන් ඉවත් කිරීමේ බලය කාර්යාංශ ප්‍රසම්පාදන කමිටුව සතු වන අතර මිල ගණන් ඉදිරිපත් කළ නොහැකි නම් ඒ බව ලිඛිතව දැන්විය යුතුය.
10. හේතු දැක්වීමකින් තොරව 2024 වර්ෂය සඳහා අයදුම්කරුවකු ලෙස ලියාපදිංචි වීම සඳහා ඉදිරිපත් කර ඇති කිසියම් අයදුම්පතක් ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව සතුය.


සභාපති

දෙපාර්තමේන්තුප්‍රසම්පාදනකමිටුව

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
අංක 234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත
කොස්වත්ත, බත්තරමුල්ල

වෙබ් අඩවිය - www.slbfe.lk
දුරකතන - 0112880550 / 0112887585

# උපලේඛනය

I කොටස

**භාණ්ඩ**

1. වායුසමීකරණ යන්ත්‍ර හා අමතර කොටස්
2. පාසල් ගමන්මලු, කාර්යාලීය ගමන්මලු , අත් බෑග්, සපත්තු( කාන්තා සහ පිරිමි) සහ පිරිමි බඳ පටි
3. තිරරෙදි , බිම ඇතිරිලි කුෂන් කවර හා වෙනත් රෙදිපිළි (කාර්යාලීය)
4. ඇඟිලි සලකුණු සටහන් තැබීමේ යන්ත්‍ර
5. ස්ථාවර දුරකථන හා අමතර කොටස්
6. අකුණු සන්නායක
7. බෙහෙත් ද්‍රව්‍ය හා වෛද්‍ය උපකරණ
8. Ceramic භාණ්ඩ , පිඟන් භාණ්ඩ හා වීදුරු භාණ්ඩ
9. Water Dispenser හා පානීය ජල බෝතල්
10. විවිධ HARDWARE උපකරණ
11. ජංගම දුරකථන
12. කාර්යාලීය හා ගෘහශ්‍රිත ගෘහ භාණ්ඩ ( දැව ,වානේ,ෆයිබර් ග්ලාස්, ප්ලාස්ටික්)
13. කාර්යාලීය උපකරණ හා උපාංග(ඡායා පිටපත් යන්ත්‍ර,ෆැක්ස් යන්ත්‍ර,රෝනියෝ යන්ත්‍ර,මුද්දර යන්ත්‍ර,මුදල් ගණනය කිරීමේ යන්ත්‍ර ඇතුළුව)
14. කාර්යාලීය කාමර වෙන් කිරීම් සහ අවශ්‍ය ද්‍රව්‍ය (Partition)
15. රාජකාරී හැඳුනුම්පත් / ඇතුළුවීමේ අවසරපත් සකස් කිරීම
16. දින මුද්‍රා / නිල මුද්‍රා සකස් කිරීම
17. සනීපාරක්ෂක භාණ්ඩ
18. ක්‍රීඩා භාණ්ඩ / ක්‍රීඩා ඇඳුම්
19. කාර්ය මණ්ඩල නිල ඇඳුම්
20. ලිපි ද්‍රව්‍ය
21. කුසලාන / පදක්කම්
22. ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ සහ අමතර උපාංග (බහුමාධ්‍ය ප්‍රක්ෂේපන යන්ත්‍ර, වීඩියෝ කැමරා හා අමතර උපාංග,BETACAM ,DV Cam, Mini DV, Cassettes, CD සහ DVD නිශ්චල කැමරා සහ අමතර උපාංග, ප්‍රදර්ශනාත්මක ඒකක සහ ප්‍රදර්ශනාත්මක කාර්යයන්)
23. අත්කම් භාණ්ඩ සහ ප්‍රවර්ධන භාණ්ඩ සැපයීම (ටී ෂර්ට්, කැප්. බෑග්, පිඟන්, කුඩ, යතුරු රඳවන (Key Tag) පෑන්,තේ ඇසුරුම් ආදිය)
24. සිල්ලර බඩු / ග්‍රොසරි ද්‍රව්‍ය (සීනි, කිරිපිටි, තේ කුඩු, කෝපි)
25. සෞඛ්‍ය ආරක්ෂිත උපකරණ හා ද්‍රව්‍ය(උදා-මුඛ ආවරණ,මුහුණු ආවරණ,අත් වැසුම්,හිස් වැසුම්,ආරක්ෂිත ඇඳුම්)
26. විෂබීජ නාශක දියර හා ඒ ආශ්‍රිත අනෙකුත් සනීපාරක්ෂක ද්‍රව්‍යයන්

II කොටස

**සේවාවන්**

27. ප්‍රචාරක දැන්වීම් කටයුතු (බැනර් ඇඳීම ,නිර්මාණාත්මක කාර්යයන් (Art Work), ප්‍රදර්ශන පුවරු ,ප්‍රදර්ශණ කුටි,සෙට් ඩිසයිනින්, Digital Printing)
28. ඇලුමිනියම් සැකසීම් (දොරවල්, ජනේල, සිවිලිම්, කාර්යාලිය කාමර වෙන් කිරීමේ සේවා සහ එම ශිල්පීය සේවාවන්)
29. ආහාරපාන සංග්‍රහ කටයුතු සේවා සැලසීම
30. පවිත්‍රතා සේවා සැපයීම
31. ආරක්ෂක සේවා සැපයීම
32. කුරියර් සේවාව සැපයීම
33. කාර්ගෝ සේවාව සැපයීම

34. පොත් ප්‍රකාශන ආයතන
35. ප්‍රවාහන පහසුකම් (කාර්,වෑන් , ඩබල් කැබ් රථ , බස්, ලොරි, ආදිය කුලී පදනම මත සැපයීමේ සේවා)
36. උපදේශන සේවා ( ගොඩනැගිලි ඉදිකිරීම් හා අළුත්වැඩියා කටයුතු)
37. ඉදිකිරීම් (ගොඩනැගිලි) කොන්ත්‍රාත් ආයතන -(ICTA ආයතනයේ ලියාපදිංචි ආයතන)
38. අභ්‍යන්තර නිර්මාණ වැඩ කටයුතු (interior Design& Work) - (ICTA ආයතනයේ ලියාපදිංචි ආයතන)
39. ශිල්පීය සැපයීම් සේවා

    39.1පෙදරේරු /පයිප්ප වැඩ
    39.2වඩු වැඩ / දැව පොලිෂ්කරුවන්
    39.3වෙල්ඩින්කරුවන් , ලියවන පට්ටල් සේවා
    39.4ගොඩනැගිලි පින්තාරු කිරීම / සුළු අලුත්වැඩියා කටයුතු විදුලි පරිපථ
    39.5යාන්ත්‍රික උපකරණ හා සම්බන්ධ සේවාවන් / විදුලි හා ජල මෝටර් එතීම

40. මළ අපවහන පද්ධති ඉදිකිරීම් හා අපජලය බැහැර කිරීම ආශ්‍රිත සේවා සැපයීම
41. කාර්යාලීය පුටු කුෂන් කිරීම හා කාර්යාලීය ගෘහ භාණ්ඩ අළුත්වැඩියාව
42. රේගු සේවා සැපයීම
43. උත්සව කටයුතු සඳහා නර්තන කණ්ඩායම් සැපයීම
44. ගලි පවිත්‍ර කිරීමේ සේවා / මළ අපවහන සේවා සහ සනීපාරක්ෂක බහාලුම් සේවා
45. විදුලි හා වායු සමීකරණ කටයුතු සම්බන්ධ සේවා
46. විගණන කටයුතු සහ වෘත්තීමය උපදේශන සේවා සැපයීම
47. ගෙවතු අලංකරනය / ගෘහස්ථ මල් පැළෑටි සැපයීමේ සේවා
48. කේබල් රූපවාහිනි සහ චන්ද්‍රිකා රූපවාහිනි පහසුකම්
49. කෘමීන් / මදුරුවන් හා මීයන් මර්ධන සේවා
50. වීඩියෝ කිරීම, ඡායාරූප ගැනීම, සේයා පටල සේදීම හා මුද්‍රණය , ඡායාරූප රාමු කිරීම, ලැමිනේටින් කිරීමේ සේවා, ඇල්බම් සකස් කිරීම , Box Mount කිරීම
51. විදුලි සෝපාන අළුත්වැඩියා කිරීමේ සේවා
52. කාර්යමණ්ඩලපුහුණුකිරීම (තොරතුරුතාක්ෂණ , පරිපාලනහාමානවසම්පත්, මුදල් , තාක්ෂණික , නීතිප්‍රසම්පාදන , විගනන , භාෂාආදී )
53. දුරකතන පද්ධතිය සහ මහජන ඇමතුම් සේවා
54. කම්කරු සැපයුම් සේවා
55. හෝටල් සහ රෙස්ටුරන්ට් (ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන මණ්ඩලය හෝ නාගරික සංවර්ධන අධිකාරියේ ලියාපදිංචිය සහිත)
56. රක්ෂණ සමාගම් (කාර්යාලීය නිලධාරීන්, විගමනික ශ්‍රමිකයින්, වාහන, ගොඩනැගිලි, කාර්යාලීය උපකරණ, විදේශ සංචාර ආදී)

III කොටස

**වාහන අමතර කොටස් මිලදී ගැනීම, අළුත්වැඩියා හා නඩත්තුව**

57. වාහන සඳහා Audio players ,Video Players සහ Reverse Camera සැපයීම හා සවිකිරීම
58. වාහන සඳහා අමතර කොටස්
59. වාහන සඳහා වායු සමීකරණ පද්ධතියේ අලුත්වැඩියා කටයුතු සම්බන්ධ සේවා
60. වාහන විදුලි පරිපථ පද්ධතියේ අළුත්වැඩියා හා සම්බන්ධ සේවා
61. වාහන වාර සේවා කටයුතු ( වාහන අභ්‍යන්තර / බාහිර සේදීමේ කටයුතු ඇතුළුව)
62. වාහන අලුත්වැඩියාව (ටින්කර් කිරීම , පේන්ට් කිරීම හා යාන්ත්‍රික අලුත්වැඩියාව)
63. ත්‍රීවීල්,යතුරුපැදි සම්බන්ධ සියලුම අලුත්වැඩියා කටයුතු
64. ත්‍රීවිල් , යතුරුපැදි සම්බන්ධ වාර සේවා කටයුතු
65. වාහන කුෂන් කිරීමේ සේවා
66. වීල් බැලන්ස් කිරීම හා වීල් එලයිමන්ට් කිරීමේ සේවා
67. වාහන සඳහා ටයර් , ටියුබ් ,බැටරි

IVකොටස

**තොරතුරු තාක්ෂණ සම්බන්ධ උපාංග මිලදී ගැනීම , සේවා සැපයීම සහ විදුලි උපකරණ**

68. මෘදුකාංග පැකේජ (System Software and Application Software) මිලදී ගැනීම සහ අදාල සේවා සැපයීම
69. පරිගණක යන්ත්‍ර, Laptop පරිගණක , මුද්‍රණ යන්ත්‍ර, පරිගණක ආශ්‍රිත සියළුම උපාංග, දෘඩාංග, ගුවන් ගමන් බලපත්‍ර කියවන යන්ත්‍ර ( Passport Scanners), UV Light Readers ,කාර්යාංශ ආරක්ෂිත මුද්දර කියවන (Bar Code Readers) යන්ත්‍ර සහ ඒ ආශ්‍රිත උපාංග මිලදී ගැනීම
70. පරිගණක යන්ත්‍ර, Laptop පරිගණක, මුද්‍රණ යන්ත්‍ර, පරිගණක ආශ්‍රිත සියළුම උපාංග, දෘඩාංග, ගුවන් ගමන් බලපත්‍ර කියවන යන්ත්‍ර ( Passport Scanners), UV Light Readers, කාර්යාංශ ආරක්ෂිත මුද්දර කියවන (Bar Code Readers) යන්ත්‍ර සහ ඒ ආශ්‍රිත උපාංග නඩත්තු කිරීම, අලුත්වැඩියා සහ සේවා සැපයීම
71. Toners, Cartridges, Ribbons, Ink (පරිගණක මුද්‍රණ යන්ත්‍ර ,ඡායාපිටපත් යන්ත්‍ර , ෆැක්ස් සහ රෝනියෝ යන්ත්‍ර සඳහා)
72. UPS යන්ත්‍ර මිලදී ගැනීම , බැටරි මිලදී ගැනීම .UPS යන්ත්‍ර අළුත්වැඩියා සහ අමතර කොටස් මිලදී ගැනීම
73. ප්‍රධාන පරිගණක (Server) මිලදී ගැනීම , අළුත්වැඩියා කිරීම Server ආශ්‍රිත සේවා සැපයීම සහ අමතර උපාංග මිලදී ගැනීම, අදාල උපදේශන සේවා ලබා ගැනීම සහ ප්‍රධාන පරිගණක ආශ්‍රිත මෘදුකාංග මිලදී ගැනීම
74. ප්‍රධාන පරිගණක, පරිගණක, මුද්‍රණ යන්ත්‍ර, UPS යන්ත්‍ර, ඇතුළු පරිගණක ආශ්‍රිත උපකරණ කුලී පදනම මත සැපයීම
75. පරිගණක වැඩසටහන් නිර්මාණය කිරීම, නවීකරණය කිරීම ආදී ඊට අදාල සේවා සැපයීම
76. පරිගණක විද්‍යාගාර කුලී පදනම මත සැපයීම
77. පරිගණක ජාලකරණය ආශ්‍රිත සේවා සහ පරිගණක ජාල ගත කිරීමේ උපාංග සැපයීම දුරකතන කළමනාකරන පද්ධති( PABX) ජාලකරණ කටයුතු, IP/ VPN , රවුටර්, ස්විච්, පරිගණක සර්වර් පරිශ්‍ර ආශ්‍රිත සේවා , සර්වර් පරිශ්‍ර ආශ්‍රිත බිම (Floor) සැකසීම, පරිගණක ජාලකරණ රැහැන් රහිත සහ රැහැන් සහිත සේවා සැපයීම, ඩොන්ගල් (Dongle) හා රැහැන් රහිත අන්තර්ජාල සම්බන්ධතා (Router) මිල දී ගැනීම
78. තොරතුරු තාක්ෂණ උපදේශන සේවා සැපයීම
79. මෘදුකාංග බලපත්‍ර හා ආරක්ෂක සහතික (SSL Certificate) මිලදී ගැනීම
80. පරිගණක මෘදුකාංග නිර්මාණය කිරීම, ස්ථාපිතකිරීම හා ඊට අදාල සේවා සැපයීම
81. CCTV පද්ධති මිලදී ගැනීම,නඩත්තු කිරීම හා ඒ ආශ්‍රිත සේවා සැපයීම

V කොටස

**විදුලි උපකරණ සැපයීමේ හා ඒ ආශ්‍රිත සේවා**

82. විදුලි උපකරණ ( විදුලිපංකා, රූපවාහිනි යන්ත්‍ර, DVD යන්ත්‍ර සහ ගෘහමය මුළුතැන්ගෙයි උපකරණ ඇතුළුව)
83. විදුලි උපාංග හා අමතර කොටස්
84. විදුලි සෝපාන සහ අමතර කොටස්
85. විදුලි උත්පාදන යන්ත්‍ර කුලියට ගැනීම සහ මිලදී ගැනීම, අළුත්වැඩියා සහ සේවා සැපයීම
86. විදුලි / යාන්ත්‍රික / සිවිල් උපදේශන සේවා සහ ශිල්පීය( Technical) සැපයුම් සේවා සැපයීම
87. ගිනි නිවන උපකරණ සැපයීම හා ආශ්‍රිත සවිකිරීම් හා සැපයුම් සේවා

VIකොටස

**අනෙකුත් සේවා**

88. උත්සව සඳහා අවස්ථා කලමනාකරන කටයුතු
89. උත්සව කටයුතු සඳහා ආලෝකකරණය / අලංකරණ කටයුතු/ ශබ්ද විකාශන කටයුතු
90. කාර්යාලීය අලංකරණ කටයුතු
91. මාධ්‍ය උපාංග සහ සංස්කරණ කටයුතු
92. මුද්‍රණ කටයුතු (ඕෆ්සෙට් ලෙටර් ප්‍රෙස්, ඩිජිටල් ,රෙදි පින්තාරු සහ ලිපිගොනු කවර මුද්‍රණය කිරීම,දිනපොත් හා කැලැන්ඩර් මුද්‍රණය කිරීම- සඟරා ,පුවත්පත්, රිසිට් පොත්
93. සංයුක්ත තැටි කොපි කිරීම
94. යතුරු ලියන අලුත්වැඩියා කටයුතු
95. භාෂා පරිවර්තන කටයුතු( සිංහල, ඉංග්‍රිසි, දෙමළ, අරාබි, ජපන්, සහ ඉතාලි)
96. උත්සව කටයුතු සඳහා භාණ්ඩ සැපයීම (තාවකාලික කුටි (Huts ,Tents) මේස, පුටු, ශබ්ද විකාශන යන්ත්‍ර, බුමුතුරුණු, ආලෝකකරණ, Podium (පෝඩියම්), කොඩි කණු ආදිය)

97. රූපවාහිනි හා ගුවන් විදුලි වැඩසටහන් නිෂ්පාදනය, රූපවාහිනි දැන්වීම් සැකසීම,මාධ්‍ය ප්‍රචාරක කටයුතු,වීඩියෝ නිෂ්පාදනය, වීඩියෝපට සංස්කරණය හා පටිගත කිරීම,වාර්තාමය චිත්‍රපටි සහ ටෙලි නාට්‍ය නිෂ්පාදනය කිරීම
98. අබලි ද්‍රව්‍ය මිලදී ගැනීම (පරිගණක හා ආශ්‍රිත, කඩදාසි / කාර්යාලීය අබලි ද්‍රව්‍ය ඇතුළුව)
99. ගුවන් සමාගම් / ගුවන් ප්‍රවේශපත්‍ර අලෙවි නියෝජිත ආයතන
100. පෙර සැකසුම් ගොඩනැඟිලි
101. බහාළුම් සපයන්නන් (කන්ටේනර් ආදී)
102. සූර්ය විදුලි කෝෂ සවි කිරීම , අමතර කොටස් සැපයීම හා සේවා සැපයීම

- සැපයුම්කරුවන් ලියා පදිංචි කිරීමේ අයදුම්පත